" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අපි කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2023.06.21

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කම්ටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛය පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.06.09 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2014.10.27 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2014 | 2006.01.01 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ හා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නව සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධානයන් බලාත්මක වීම. |

02. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එක්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) ,
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 3/2014

මගේ අංකය: PSC/APP/8/2/52/2014

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක: 177,
නාවල පාර, නාරාහේන්පිට.

2014 ඔක්තෝබර් මස 27 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සහා ප්‍රධාන ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>2006.01.01 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ හා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නව සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධානයන් බලාත්මක වීම</u>**

ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් අංක SC(FR) 312/2008 හි නඩු තීන්දුවට අනුව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන ඉහත සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධානයන් බලාත්මක වීම සම්බන්ධව පහත සඳහන් පරිදි කටයුතු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

01. 2006.01.01 දිනට පසු සේවයට බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සියලුම නිලධාරින් 2013 නොවැම්බර් 11 දිනැති අංක 1836/06 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, මතුවට සංශෝධනය කළ හැකි වන්නාවූ ද, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වනු ඇත.

02. 2006.01.01 දිනට පසු සේවයට බඳවා ගන්නා ලද සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සියලුම නිලධාරින් 2013 දෙසැම්බර් 13 දිනැති අංක 1840/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, මතුවට සංශෝධනය කළ හැකි වන්නාවූ ද, ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වනු ඇත.

03. 2006.01.01 දිනට පසු සේවයට බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ සියලුම නිලධාරින් 2014 අගෝස්තු 29 දිනැති අංක 1877/52 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, මතුවට සංශෝධනය කළ හැකි වන්නාවූ ද, ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වනු ඇත.

04. ඉහත සඳහන් එක් එක් සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධාන අනුව 2006.01.01 දිනට එම සේවාවන්හි III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ හා 2006.01.01 දින සිට නව සේවා ව්‍යවස්ථාවන් ප්‍රසිද්ධියට පත්කරන ලද දිනයන් දක්වා II පන්තියේ I ශ්‍රේණියට උසස්වීම් ලද සියලුම නිලධාරීන්, පෙර සේවා ව්‍යවස්ථාවන් අනුව II පන්තියේ I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති දිනයන්හි සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කරනු ලැබ ඇති බවට සලකනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.එම්.එල්.සී.සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.